# එකාදසමො පාඨො

# චූලෙකසාටකබ්‍රාහ්මණස්ස දානං

විපස්සිදසබලස්ස කාලස්මිඤ්හි මහාඑකසාටකබ්‍රාහ්මණො නාම අහොසි. අයං පන එතරහි සාවත්ථියං චූලෙකසාටකො නාම. තස්ස හි එකො නිවාසනසාටකො අහොසි, බ්‍රාහ්මණියාපි එකො. උභින්නම්පි එකමෙව පාරුපනං, බහි ගමනකාලෙ බ්‍රාහ්මණො වා බ්‍රාහ්මණී වා තං පාරුපති. අථෙකදිවසං විහාරෙ ධම්මස්සවණෙ ඝොසිතෙ බ්‍රාහ්මණො ආහ. ''භොති ධම්මසවණං ඝොසිතං, කිං දිවා ධම්මස්සවණං ගමිස්සසි, උදාහු රත්තිං. පාරුපනස්ස හි අභාවෙන න සක්කා අම්හෙහි එකතො ගන්තු''න්ති. බ්‍රාහ්මණී, ''සාමි, අහං දිවා ගමිස්සාමී''ති සාටකං පාරුපිත්වා අගමාසි. බ්‍රාහ්මණො දිවසභාගං ගෙහෙ වීතිනාමෙත්වා රත්තිං ගන්ත්වා සත්ථු පුරතො නිසින්නොව ධම්මං අස්සොසි. අථස්ස සරීරං ඵරමානා පඤ්චවණ්ණා පීති උප්පජ්ජි. සො සත්ථාරං පූජිතුකාමො හුත්වා ''සචෙ ඉමං සාටකං දස්සාමි, නෙව බ්‍රාහ්මණියා, න මය්හං පාරුපනං භවිස්සතී''ති චින්තෙසි. අථස්ස මච්ඡෙරචිත්තානං සහස්සං උප්පජ්ජි, පුනෙකං සද්ධාචිත්තං උප්පජ්ජි. තං අභිභවිත්වා පුන මච්ඡෙරසහස්සං උප්පජ්ජි. ඉතිස්ස බලවමච්ඡෙරං බන්ධිත්වා ගණ්හන්තං විය සද්ධාචිත්තං පටිබාහතියෙව. තස්ස''දස්සාමි, න දස්සාමී''ති චින්තෙන්තස්සෙව පඨමයාමො අපගතො, මජ්ඣිමයාමො සම්පත්තො. තස්මිම්පි දාතුං නාසක්ඛි. පච්ඡිමයාමෙ සම්පත්තෙ සො චින්තෙසි. ''මම සද්ධාචිත්තෙන මච්ඡෙරචිත්තෙන ච සද්ධිං යුජ්ඣන්තස්සෙව ද්වෙයාමා වීතිවත්තා, ඉදං මම එත්තකං මච්ඡෙරචිත්තං වඩ්ඪමානං චතූහි අපායෙහි සීසං උක්ඛිපිතුං න දස්සති, දස්සාමි න''න්ති. සො මච්ඡෙරසහස්සං අභිභවිත්වා සද්ධාචිත්තං පුරෙචාරිකං කත්වා සාටකං ආදාය සත්ථුපාදමූලෙ ඨපෙත්වා 'ජිතං මෙ. ජිතං මෙ''ති තික්ඛත්තුං මහාසද්දමකාසි.

**(ධම්මපදට්ඨකථා)**

## පදමාලාව

| | | | |
|---|---|---|---|
| **විපස්සිදසබලස්ස** | **(ස)** | - | විපස්සි බුදුරදුන්ගේ |
| **කාලස්මිඤ්හි** | **(සං)** | - | කාලයෙහි වනාහි |
| **මහාඑකසාටකබ්‍රාහ්මණො** | **(ස)** | - | එනම් ඇති බමුණා, (එක්සළුවක් ඇති බමුණා) |
| **අහොසි** | **(ක්‍රි)** | - | විය |
| **එතරහි** | **(නි)** | - | දැන් |
| **නිවාසනසාටකො** | **(ස)** | - | අඳිනා සළුව |
| **උභින්නම්පි** | **(සං)** | - | දෙදෙනාම |
| **එකමෙව** | **(සං)** | - | එක ම |
| **පාරුපණං** | **(නා)** | - | පොරවන |
| **බහි ගමනකාලෙ** | **(ස)** | - | බැහැරට යන කල්හි |
| **පාරුපති** | **(ක්‍රි)** | - | පොරවයි |
| **අථෙකදිවසං** | **(සං)** | - | ඉක්බිති එක් දවසක් |

| | | |
|---|---|---|
| ඝොසිතෙ | (කි) - | ශබ්ද කළ කල්හි |
| උදාහු | (නි) - | නැතහොත් |
| අභාවෙන | (ස) - | නොමැතිකමින් |
| න සක්කා | (නි) - | නො හැකිය |
| අම්හෙහි | (ස.නා) - | අප විසින් |
| දිවසභාගං | (ස) - | දහවල් කාලය |
| වීතිනාමෙත්වා | (පූ.ක්‍රි) - | කල්යවා, ඉක්මවා |
| සත්ථු පුරතො | (ස) - | බුදුරදුන්ගේ ඉදිරියෙහි |
| අස්සොසි | (ක්‍රි) - | ඇසීය |
| අථස්ස | (සං) - | ඉක්බිති ඔහුගේ, ඉක්බිති ඔහුට |
| ඵරමානා | (කි) - | පැතිරෙන |
| පූජිතුකාමො | (කි) - | පුදනු කැමැති ව |
| හුත්වා | (පූ.ක්‍රි) - | වී |
| සචෙ | (නි) - | ඉදින් |
| මච්ඡෙරචිත්තානං | (ස) - | මසුරුසිත් |
| සහස්සං | (න) - | දහසක් |
| සද්ධාචිත්තං | (ස) - | සැදැහැ සිතක් |
| අභිභවිත්වා | (පූ.ක්‍රි) - | යටපත් කොට / මැඩගෙන |
| බලවමච්ඡෙරං | (ස) - | බලවත් මසුරුකම |
| පටිබාහති | (ක්‍රි) - | වළකියි |
| චින්තෙන්තස්සෙව | (ක්‍රි) - | සිතන්නහුට ම |
| පඨමයාමො | (ස) - | පළමු යාමය |
| අපගතො | (කි) - | ඉකුත්විය |
| සම්පත්තෙ | (කි) - | උදාවූ කල්හි, සම්ප්‍රාප්ත වූ කල්හි |
| තස්මිම්පි | (සං) - | එහිදී ද |
| නාසක්ඛි | (ස) - | නොහැකි විය |
| එත්තකං | (ති) - | මෙපමණ |
| වඩ්ඪමානං | (කි) - | වැඩෙන්නේ |
| උක්ඛිපිතුං | (තු) - | ඔසවන්නට |
| පුරෙචාරිකං | (ස) - | පෙරටු |
| ජිතං | (කි) - | දිනන ලද |
| තික්ඛත්තුං | (නි) - | තුන්වරක් |
| මහාසද්දමකාසි | (සං) - | මහා ශබ්දයක් කළේය |

**අභ්‍යාස**

01. පාලියෙන් පිළිතුරු සපයන්න.

i. චූලෙකසාටකො බ්‍රාහ්මණො කත්‍ථ වසි ?
ii. තස්ස කිත්තකා සාටකා?
iii. ධම්මසවණාය ගොසිතෙ බ්‍රාහ්මණො බ්‍රාහ්මණිං කිං අවොච ?
iv. කස්මා බ්‍රාහ්මණස්ස සද්ධාචිත්තං පටිබාහි ?
v. බ්‍රාහ්මණො 'ජිතං මෙ'ති කතික්ඛත්තුං සද්දමකාසි ?

02. පිළිතුරු සපයන්න.

i. මහා එකසාටක බමුණා විසුවේ කවර කාලයක ද?
ii. නිවාසනසාටකයේ සහ පාරුපනසාටකයේ වෙනස කුමක් ද?
iii. මසුරුකම දුරලීමට පුරුදු කළයුතු ගුණාංග තුනක් ලියන්න.
iv. රාත්‍රියක දී ඉක්මී යන යාම තුන නම් කරන්න.
v. මෙම කථා පුවතෙන් ගත හැකි ආදර්ශ දෙකක් ලියා දක්වන්න.

03. ඉහත ඡේදය ආශ්‍රයෙන් පාලියට නගන්න.

i. අත්‍ථදස්සි බුදුරදුන්ගේ කාලයේ සුමන නම් ගොවියෙක් විය.
ii. ඔහු කුඹුරට යන කල්හි බිරිය සමග ම යයි.
iii. ඉක්බිති එක් දවසක් එක් මගියෙක් ඇවිත් ඔහුගෙන් උදැල්ල (කුද්දාලං) ඉල්ලුවේ ය.
iv. ඔහු උදැල්ල දෙම්දෝ නොදෙම්දෝයි සිතමින් ම බොහෝ වේලාවක් ඉක්මවී ය.
v. මසුරු සිත සමග යුද්ධ කොට එය මැඩපවත්වා 'මං දිනුවා මං දිනුවා'යැයි කියමින් ම ඔහුට උදැල්ල දුන්නේ ය.

## ව්‍යඤ්ජන සන්ධි

ව්‍යඤ්ජනාක්ෂරයන්ට මූලිකත්වය දී පර පදයේ ව්‍යඤ්ජන අකුරක් ඇති විට කරනු ලබන සන්ධිය ව්‍යඤ්ජන සන්ධි නම් වේ. බාලාවතාරයට අනුව ව්‍යඤ්ජන සන්ධියේ ප්‍රභේද හතරක් දක්නට ඇත.

i. **ලෝපාගම සන්ධිය**
ii. **අසමාන ද්විත්‍ව සන්ධිය**
iii. **ඔකාරාගම සන්ධිය**
iv. **ඔකාරාදේශ සන්ධිය**

### ලෝපාගම සන්ධිය

බ්‍යඤ්ජනාක්ෂරයක් පර කල්හි මුලින් ඇති ස්වරය ඇතැම් විට ලොප් වේ. ඒ ලොප් කළ තැනට 'අ'කාරයක් ආගම වේ. මෙය සිදුවනුයේ බාලාවතාරයේ ඇති **'ලොපඤ්ච තත්‍රාකාරො'** යන සූත්‍රයෙනි. මෙම සූත්‍රයේ ඇති 'ච'කාරයේ බලයෙන් ඇතැම් විට 'උ'කාරයක් ද, 'ඔ'කාරයක් ද ආගම වේ.

| | | |
|---|---|---|
| සො + මුනි | | ජානෙම + තං |
| ස් + ඔ + මුනි | | ජානෙම් + අ + තං |
| ස් + අ + මුනි | ලොපඤ්ච තත්‍රාකාරො | ජානෙම් + උ + තං |
| සමුනි ← | නයෙ පරං යුත්තෙ | → ජානෙමුතං |

කච්චිනු + ත්වං > කච්චිනොත්වං

### අසමාන ද්විත්ව සන්ධිය

අක්ෂර මාලාවේ ඇති වර්ගාක්ෂරයන්ගේ දෙවැනි හතරවැනි අක්ෂරයන්ට පිළිවෙලින් පළමුවැනි, තුන්වැනි අකුරු ද්විත්ව වේ. මෙය සිදුවනුයේ **'වග්ගෙ ඝොසාඝොසානං තතියපඨමා'** යන බාලාවතාර සූත්‍රයෙනි. මෙහි දී සිදුවනුයේ මහාප්‍රාණ අක්ෂරයන්ට අල්පප්‍රාණ අක්ෂර ද්විත්ව වීම යි.

| | | | |
|---|---|---|---|
| ඛ - ක | අ + ඛාතො | - අක්ඛාතො | වග්ගෙ ඝොසා'ඝොසානං තතියපඨමා |
| ඝ - ග | උ + ඝොසො | - උග්ඝොසො | |
| ඡ - ච | සෙත + ඡත්ත | - සෙතච්ඡත්ත | |
| ඣ - ජ | අ + ඣායක | - අජ්ඣායක | |
| ඨ - ට | ගත + ඨාන | - ගතට්ඨාන | |
| ථ - ත | සාරිපුත්ත + ථෙර | - සාරිපුත්තත්ථෙර | |
| ධ - ද | ඡ + ධා | - ඡද්ධා | |
| ඵ - ප | දුම + ඵලා | - දුමප්ඵලා | |
| භ - බ | මහා + භය | - මහබ්භය | |

| | |
|---|---|
| **ඔකාරාගම සන්ධිය** | බ්‍යඤ්ජනයක් පර කල්හි සමහර තැනෙක්හි **'ක්වචි ඔ ව්‍යඤ්ජනෙ'** යන සූත්‍රයෙන් 'ඔ'කාරයක් ආගම වේ.<br>පර + සහස්සං<br>පර් + අ + සහස්සං - පුබ්බමධොඨිතමස්සරං සරෙන වියොජයෙ<br>පර් + අ + ඔ සහස්සං - ක්වචි ඔ ව්‍යඤ්ජනෙ<br>පර් + ඔ + සහස්සං - සරා සරෙ ලොපං<br>පරොසහස්සං - නයෙ පරං යුත්තෙ |

| | |
|---|---|
| **ඔකාරාදේශ සන්ධිය**<br><br>**අව > ඔ** | බ්‍යඤ්ජනයක් පර කල්හි ඇතැම් විට **'ඔ අවස්සෙ'** යන සූත්‍රයෙන් අව යන උපසර්ගයට 'ඔ'කාරයක් ආදේශ වේ. ඇතැම් තැන්වල මෙය සිදු නො වේ.<br>අව+ කාසො<br>ඔ + කාසො - ඔ අවසෙස<br>ඔකාසො - නයෙ පරං යුත්තෙ<br><br>අව > නද්ධා - ඔනද්ධා, අව > රොහති - ඔරොහති |

## නිග්ගහීත සන්ධිය

නිග්ගහීතයට මූලිකත්වය දෙමින් සිදු කරනු ලබන සන්ධිය නිග්ගහීත සන්ධි නම් වේ. මෙහි පූර්වපදයේ අන්තය නිග්ගහීතයකින් යුක්ත වන අතර පරපදය ස්වරයකින් හෝ ව්‍යඤ්ජනයකින් යුක්ත වේ. බාලාවතාරයට අනුව නීග්ගහීත සන්ධිය ද ප්‍රභේද හතරකින් යුක්ත වේ.

i. **ආදේශ සන්ධිය** ii. **ආගම සන්ධිය**
iii. **ලෝප සන්ධිය** iv. **විසඤ්ඤොග සන්ධිය**

ආදේශ සන්ධිය ද නැවත කොටස් 04කින් යුක්ත වේ.

i. **වර්ගාන්තාදේශය** ii. **'ම'කාරාදේශය**
iii. **'ද'කාරාදේශය** iv. **'ඤ'කාරාදේශය**

## වර්ගාන්තාදේශය

'ක'වර්ග 'ච'වර්ග ආදී වර්ග බ්‍යඤ්ජනාක්ෂරයක් පරපදයේ තිබී පූර්ව පදාන්තයේ නිග්ගහීතයක් ඇති විට එම නිග්ගහීතයට පර වූ වර්ග බ්‍යඤ්ජනාක්ෂරයේ වර්ගාන්තාක්ෂරය හෙවත් අනුනාසික්‍ය අක්ෂරය ආදේශ වේ. **(වග්ගන්තං වා වග්ගෙ)**

| | | |
|---|---|---|
| ඞ | සරණංකරො > සරණඞ්කරො, සංඛාත > සඞ්ඛාත<br>සංගායනා > සඞ්ගායනා, සංඝාදිසෙස > සඞ්ඝාදිසෙස | වග්ගන්තං වා වග්ගෙ |
| ඤ | සංචාර > සඤ්චාර, සංඡින්දති > සඤ්ඡින්දති<br>සංජීව > සඤ්ජීව, සංඥාපන > සඤ්ඥාපන | |
| ණ | සංඨිතො > සණ්ඨිතො පුංඩරීක > පුණ්ඩරීක | |
| න | සං තොස > සන්තොස සංථාර > සන්ථාර<br>සංදෙහ > සන්දෙහ තං ධනං > තන්ධනං | |
| ම | සං පටිච්ඡන > සම්පටිච්ඡන සං ඵුට්ඨ > සම්ඵුට්ඨ<br>සං බන්ධ > සම්බන්ධ සං භාවනා > සම්භාවනා | |
| | මෙහි ඇති 'ව'කාරයේ බලය මත ලකාරය පර කල්හි ද නිග්ගහීතයට 'ල'කාරයක් ආදේශ වේ.<br>පුං ලිංග > පුල්ලිඞ්ග<br>සං + ලෙඛ > සල්ලෙඛ | |

**'ම'කාරාදේශය හා 'ද'කාරාදේශය**

ස්වරයක් පර කල්හි ඊට මුලින් ඇති නිග්ගහීතයට **'මදාසරෙ'** යන සූත්‍රයෙන් 'ම'කාරයක් හෝ 'ද'කාරයක් ආදේශ වේ.

| | | | | |
|---|---|---|---|---|
| එවං + එව | | | | යං + අනිච්චං |
| එව + ම් + එව | ← ම් | මදාසරෙ | ද් → | ය + ද් + අනිච්චං |
| එවමෙව | | නයෙ පරං යුත්තෙ | | යදනිච්චං |

**'ඤ'කාරාදේශය** - I

'එ'කාරය හෝ 'හ'කාරය පරව සිට පූර්වයේ නිග්ගහීතයක් වේ නම් එයට 'ඤ'කාරයක් ආදේශ වේ. මෙය සිදුවනුයේ **'එහෙඤඤං'** යන සූත්‍රයෙනි.

| | | |
|---|---|---|
| තං + එව | | |
| තඤ් + එව | - | එහෙඤඤං |
| ත + ඤ් + ඤ් + එව | - | පරද්වෙභාවො ඨානෙ |
| තඤ්ඤේව | - | නයෙ පරං යුත්තෙ |

තං + හි > තඤ්හි

**'ඤ'කාරාදේශය** - II

'ය'කාරය පර කල්හි ද මුළින් ඇති බිංදුවට එම 'ය'කාරය ද සමගින් 'ඤ'කාරයක් ආදේශ වේ. මෙය .... බාලාවතාරයේ **'සයෙච'** යන සූත්‍රයෙන් සිදුවේ.

| | |
|---|---|
| සං + යොගො | |
| සං + ය් + ඔ + ගො | - පුබ්බමධොඨිතමස්සරං සරෙන වියොජයෙ |
| ස + ඤ් + ඔගො | - සයෙච |
| ස + ඤ් + ඤ් + ඔගො | - පරද්වෙභාවො ඨානෙ |
| සඤ්ඤොගො | - නයෙ පරං යුත්තෙ |

**ආගම සන්ධිය**

ස්වරයක් හො ව්‍යඤ්ජනයක් පරකල්හි ඇතැම් තැනෙක බිඳුව ආගම වේ. **(නිගගහීතඤව)**

නිද : චක්ඛු + උදපාදි > චක්ඛුං උදපාදි
අව + සිරො > අවංසිරො
අණු + ථූලානි > අණුංථූලානි

## ලෝප සන්ධිය

i. **ක්වචි ලොපං** යන සූත්‍රයෙන් ස්වරයා පරකල්හි නිග්ගහීතය ලොප් වේ.

විදූනං + අග්ගං > විදූනග්ගං
අදාසිං + අහං > අදාසහං

ii. **බ්‍යඤ්ජනෙ ච** යන සූත්‍රයෙන් බ්‍යඤ්ජන අකුරක් පරකල්හි ද නිග්ගහීතය ලොප් වේ.

| | | | | |
|---|---|---|---|---|
| බුද්ධානං | + | සාසනං | > | බුද්ධානසාසනං |
| අරියසච්චානං | + | දස්සනං | > | අරියසච්චානදස්සනං |

iii. **පරො වා සරො** යන සූත්‍රයෙන් බින්දුවෙන් පරව ඇති ස්වරය ලොප් වේ. ස්වරය ලොප් වූ පසු වර්ගාන්තා දේශය ද වේ.

| | | | |
|---|---|---|---|
| දුතියං | + | අපි | |
| දුතියං | + | පි | පරො වා සරො |
| දුතියම්පි | . | | වග්ගන්තං වා වග්ගෙ |

| | | | |
|---|---|---|---|
| අභිනන්දුං | + | ඉති | . |
| අභිනන්දුං | + | ති | .පරො වා සරො |
| අභිනන්දුන්ති | . | | වග්ගන්තං වා වග්ගෙ |

## විසඤ්ඤොගසන්ධිය

**බ්‍යඤ්ජනො ච විසඤ්ඤොගො** යන සූත්‍රයෙන් බින්දුවෙන් පර ස්වරය ලොප්කළ පසු සංයුක්ත ව්‍යඤ්ජනය විසංයුක්ත වේ. මෙහි දී මුලින් ඇති ව්‍යඤ්ජනය ලොප් වේ.

| | |
|---|---|
| එවං + අස්ස | |
| එවං + ස්ස | පරො වා සරො |
| එවං + ස | බ්‍යඤ්ජනො ච විසඤ්ඤොගො |
| එවංස | නයෙ පරං යුත්තෙ |

**අභ්‍යාස**

01. සිංහලට නගන්න.

i. රාජා නගරෙ චරන්තො ධම්මං දෙසෙන්තමෙකං තාපසං පස්සි.
ii. මනුස්සා ආයුක්ඛයෙන කම්මක්ඛයෙන පුඤ්ඤක්ඛයෙන ච මරන්ති.
iii. අප්පමාදො අමතං පදං පමාදො මච්චුනො පදං.
iv. සබ්බෙව මයං ධම්මං සුත්වා තං සාධුකං මනසිකරොම.
v. කරොමි තෙ තං වචනං'ත්වංසි ආචරියො මම'.
vi. ආනන්දත්ථෙරො විපස්සනං වඩ්ඪෙත්වා පච්ඡිමයාමෙ යෙව අරහත්තමපාපුණි.
vii. ධම්මදෙසනාවසානෙ භික්ඛවො සාරිපුත්තත්ථෙරස්ස වචනං සුත්වා සම්මොදිංසු.
viii. අත්තමනා තෙ භික්ඛු භගවතො භාසිතං අභිනන්දුන්ති.

02. සන්ධි කළයුතු තැන් සන්ධි කොට පාලියට නගන්න.

i. දෙව්වරු පින් ගෙවීමෙන් ද ආයුෂ ගෙවීමෙන් ද දෙව්ලොවින් චුත වෙති.
ii. රූපය පෙණ පිඬක් වැනි යැයි තථාගතයන් වහන්සේ වදාළහ.
iii. මිනිස්සු ආර්ය සංඝයාට දන් දී මහත්ඵල මහානිසංස ලබත්.
iv. ධෛර්‍යමත් සාමණේරවරු උදෑසනම නැඟිට බුදුන් වැඳ පාඩම් කරත්.
v. දැහැමි පාලකයෝ බුද්ධ ශාසනය ද විහාරාරාමයන් ද ආරක්ෂා කරත්.

03. 'චූලෙකසාටකබ්‍රාහ්මණස්ස දානං' යන ඡේදයේ එන සන්ධිපද තෝරා වගු ගත කරන්න.

| සන්ධිපදය | විසන්ධිපදය | බාලාවතාරසූත්‍ර |
|---|---|---|
| උදා:- කාලස්මිඤ්හි | කාලස්මිං හි | එහෙඤ්ඤං |

04. හිස්තැන් පුරවන්න.

i. මහාප්‍රාණ අක්ෂරයන්ට අල්පප්‍රාණ අක්ෂර ද්විත්ව වීම.............................. නම් වේ.
ii. බිංදුවෙන් පරවූ ස්වරයක් ඇතිවිට.......................සූත්‍රයෙන් 'ම' කාරාදේශ වේ.
iii. ව්‍යඤ්ජන සන්ධියේ දී සන්ධි කාර්යයන් දෙකක් එකවිට සිදුවනුයේ ........... සූත්‍රයෙනි.
iv. 'අවනද්ධා' යන පදය.....................ලෙස.....................යන සූත්‍රයෙන් සන්ධි වේ.
v. බිංදුවෙන් පරවූ ස්වරය ලොප් වනුයේ...........................යන සූත්‍රයෙනි.